(හයවැනි පාර්ලිමේන්තුව — තෙවැනි සභාවාරය)

අංක. 3(1)]

# පාර්ලිමේන්තුවේ අංක 3 දරන න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2009 අප්‍රේල් මස 22 වැනි බදාදා**

## 2009 මැයි මස 05 වැනි අඟහරුවාදා
## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0897/'08

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) නැගෙනහිර පළාත් සහා මැතිවරණ රාජකාරී සඳහා යෙදවූ ඡන්ද මධ්‍යස්ථාන භාර නිලධාරීන්ගේ නාම ලේඛනය, එම නිලධාරීන් සේවය කරන ආයතන සහ තනතුර, අම්පාර, මඩකලපුව සහ ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්කයන්ට අදාළව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) උතුරු මැද හා සබරගමුව, පළාත් සභා මැතිවරණ රාජකාරී සඳහා යෙදවූ ඡන්ද මධ්‍යස්ථාන භාර නිලධාරීන්ගේ නාම ලේඛනය එම නිලධාරීන් සේවය කරන ආයතන, තනතුර සහ දිස්ත්‍රික්කය ලෙස වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) මේ අනුව නැගෙනහිර, උතුරු මැද සහ සබරගමුව පළාත් සභා මැතිවරණවලදී ඡන්ද මධ්‍යස්ථාන මට්ටමින් සහ ශාලා අංක අනුව ගණන් කිරීමේ ප්‍රධාන නිලධාරී ඇතුළු අනෙකුත් නිලධාරීන්ගේ නාම ලේඛනය, ලිපිනයන් සහ සේවා ස්ථානයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) නැගෙනහිර, උතුරු මැද සහ සබරගමුව පළාත් සභා මැතිවරණ දිනයන්හිදී ක්‍රියාත්මක වූ පරිගණක කාර්යාලයේ නිලධාරීන්ගේ නම, තනතුර සහ ආයතනයන් වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1112/'08

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩලයේ ප්‍රවාහන ගිණුම් නිලධාරී තනතුරට පත්කරනු ලැබ ඇත්තේ කවුරුන්ද;

(ii) ඔහුගේ සම්පූර්ණ නම හා පෞද්ගලික ලිපිනය කවරේද;

(iii) ඔහුගේ අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම් කවරේද;

(iv) ඔහු එම තනතුරට බඳවාගෙන ඇත්තේ කවර පදනමකින්ද;

(v) ඔහුගේ මූලික වැටුප, සියලු දීමනා සහිතව ලබන වැටුප, ලබන වෙනත් වරප්‍රසාද හා දීමනා කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1142/'08

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,— කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) කෘෂිකර්ම සංවර්ධන අධිකාරිය 2002.12.31 වැනි දින ඇවර කරන ලද බවට 2004.02.31 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය මගින් ප්‍රසිද්ධියට පත්කර ඇති බවත්;

(ii) සේවකයිනට ලබා දුන් වරප්‍රසාද අනුව වන්දි ලබාගෙන සේවයෙන් ඉවත්වීමටත්, රාජ්‍ය සේවයට අන්තර්ග්‍රහණය වීමටත් අවස්ථාව ලබා දී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) වන්දි ලබාගෙන සේවයෙන් ඉවත් නොවූ විවිධ තනතුරු කාණ්ඩවලට අයත් සේවකයින් කොපමණ සංඛ්‍යාවක් දැනට සේවයේ යෙදී සිටින්නේද;

(ii) ඒ ඒ තනතුරු කාණ්ඩවලට අදාළව සුදුසු රාජකාරි වගකීම් පවරා දී තිබේද;

(iii) එම තනතුරු කාණ්ඩ අතුරින්, සහකාර අධ්‍යක්ෂ/කෘෂිකර්ම පර්යේෂණ සහ ඵලදාවර්ධන නිලධාරි තනතුර දරන විධායක නිලධාරීන් සඳහා ඔවුන් ලබා ඇති සේවා කුසලතා මත රාජකාරීන් පවරා තිබේද;

(iv) ඵලදායී සේවාවක් එම නිලධාරීන්ගෙන් රජයට ලබා ගන්නේ නම් ඒ කවරේද;

(v) ඉහත (ආ) (iii) නිලධාරීන් අදාළ අමාත්‍යාංශයට අනුයුක්තකර දැනට කොපමණ කාලයක් ගතවී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

මාර්ග සංවර්ධන අධිකාරිය (සංශෝධන) පනත් කෙටුම්පත —දෙවැනි වර කියවීම.

*

සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමා,— මදුරුවන් බෝවීම වැලැක්වීමේ පනත යටතේ නියෝග ,— 2007 අංක 11 දරන මදුරුවන් බෝවීම වැලැක්වීමේ පනතේ 3, 5, 13 සහ 17 වැනි වගන්ති සමග කියවිය යුතු 23 වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමා විසින් සාදන ලදුව, 2008 අගෝස්තු 22 දිනැති අංක 1563/31 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2009.04.21 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*

සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමා,— වෛද්‍ය ආඥා පනත යටතේ නියෝග,— (105 වැනි අධිකාරය වූ) වෛද්‍ය ආඥා පනතේ 72 වැනි වගන්තිය සමග කියවිය යුතු 19 වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමා විසින් ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විමසා සාදන ලදුව, 2009 පෙබරවාරි මස 25 දිනැති අංක 1590/13 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2009.04.21 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

* **සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

# 2009 මැයි මස 06 වැනි බදාදා
# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1152/'08

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) හෝමාගම සියඹලාගොඩ ඔළුපට්ටාව වැව අක්කර 16ක ප්‍රමාණයක පෞද්ගලික වැවක් ලෙස තිබියදී ගොවි සංවිධානය විසින් කරනු ලැබූ ඉල්ලීම්වලට අනුව 1968 වර්ෂයේදී එවකට කොළඹ දිසාපති විසින් කළ මැනුම් නියෝගය අනුව අත්පත් කර ගෙන ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මු:පි:කො: 880 පිඹුරට අනුව, අක්කර 12 රූ:00 පර්චස් 38.6 ක් ලෙස අත්පත් කර ගත් කොටස සිතියම් කර ඇති බවත්;

(ii) අත්පත් කර නොගත් අක්කර 4 තුළ නිවාස සෑදීමට හෝ වෙනයම් සංවර්ධනයකට ඉඩ දුනහොත් එය වැවේ අද තිබෙන තත්වයෙන් වෙනස් වී වැව අපවිත්‍රවීමට බලපාන බව ගොවි සංවිධාන විසින් විවිධ අවස්ථාවල අදාළ ආයතන වෙත දැනුම් දී ඇති බවත්;

(iii) වැව් රක්ෂිතයක අවශ්‍යතාවයක් ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) ඒ අනුව, වැව් රක්ෂිතය රැක ගැනීම වෙනුවෙන් ගන්නා පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0655/'08

ගරු රවි කරුණානායක මහතා,— වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යතුමා සහ වරාය හා ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) මේ දක්වා වූ පසුගිය වසර 4ක කාලය තුළ එක් එක් වර්ෂයේදී, වරාය හා ගුවන් සේවා අමාත්‍යාංශය විසින් සහ එම අමාත්‍යාංශයට අයත් ඕනෑම සමාගමක් සඳහා කුලියට ගත් එක් එක් වාහනය වෙනුවෙන් ගෙවන ලද මුළු මුදල හා කුලියට ලබා ගත් කාර්යාලයීය ඉඩකඩ සඳහා ගෙවන ලද මුළු මුදල කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) උක්ත කාල සීමාව තුළ—

(i) ඉහත කී වාහන සඳහා ඉන්ධන වෙනුවෙන් වැය කළ මුදල කොපමණද හා එම මුදල අමාත්‍යාංශයේ සමස්ත පුනරාවර්තන වියදම් වලින් කුමන ප්‍රතිශතයක්ද;

(ii) ඉහත සඳහන් කාර්යාලයීය ඉඩකඩ සඳහා එක් වර්ග අඩියක් වෙනුවෙන් වැය කළ මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) කල්බදු ක්‍රමය යටතේ එම ගොඩනැගිල්ල ලබා ගෙන ඇත්තේ කොපමණ කාලයක් සඳහාද හා තැන්පතුවක් ලෙස අත්තිකාරම් වශයෙන් ගෙවන ලද මුදල කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1146/'08

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2008 වර්ෂයේදී කොළඹ මහ රෝහලට ප්‍රතිකාර සඳහා පැමිණි, ශල්‍යකර්ම සිදුකළ යුතු බවට හඳුනා ගන්නා ලද හෘද රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(ii) ශල්‍යකර්ම සඳහා ලියාපදිංචි වූ හෘද රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(iii) ශල්‍යකර්ම සිදුකළ හෘද රෝගීන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශල්‍යකර්මයට භාජනය කළ යුතු එහෙත් රෝහල් පහසුකම් ප්‍රමාණවත් නොවීම මත 2008 වර්ෂයේ ශල්‍යකර්ම සිදු කිරීමට නොහැකි වූ හෘද රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(ii) 2005, 2006, 2007 වර්ෂවල එසේ ශල්‍යකර්මවලට යොමු කිරීමට නොහැකි වූ හෘද රෝගීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1113/'08

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමියගෙන් ඇසීමට,—

(අ) කොළඹ 10, මාලිගාවත්ත, රජ පොකුණ මාවතේ පදිංචි ඩබ්ලිව්. එල්. පී. සිරියාවතී මහත්මිය විසින් මාලිගාවත්ත නව නගරයේ පිහිටි රජපොකුණ නමැති නාන ළිඳ වර්ෂ 32ක පමණ කාලයක් තිස්සේ නඩත්තු කරමින් පාලනය කරන බව එතුමිය දන්නෙහිද?

(ආ) වාර්ෂිකව බදු ගෙවමින් මෙතෙක් පාලනය කළ මෙම නාන ළිඳ, වෙනත් පිරිසකට ලබාදීමට උත්සාහ ගන්නේ කවර හේතුවක් නිසාද යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම නාන ළිඳ අසල බුදු මැදුරක් ඉදිකිරීම සඳහා කටයුතු කරද්දී එය කඩා බිඳ දමා රු. ලක්ෂ 05ක පමණ අලාභයක් මැයට සිදුකර ඇති බවත්;

(ii) මෙම ස්ථානයේ වෙනත් ආගමික වතාවත් සපුරා ගැනීමට උත්සාහ කරන බවත්;

එතුමිය පිළිගන්නෙහිද?

(ඈ) දරුවන් 9 දෙනෙකුගේ මවක් වන සිරියාවතී මහත්මියට තවදුරටත් මෙම නාන ළිඳ පාලනය කිරීමට එතුමිය අවශ්‍ය කටයුතු සලසා දෙන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

1147/'08

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2008 වර්ෂයේදී කොළඹ-දකුණ කළුබෝවිල ශික්ෂණ රෝහලට ප්‍රතිකාර සඳහා පැමිණි, ශල්‍යකර්ම සිදුකළ යුතු බවට හඳුනා ගන්නා ලද හෘද රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(ii) ශල්‍යකර්ම සඳහා ලියාපදිංචි වූ හෘද රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(iii) ශල්‍යකර්ම සිදුකළ හෘද රෝගීන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශල්‍යකර්මයට භාජනය කළ යුතු එහෙත් රෝහල් පහසුකම් ප්‍රමාණවත් නොවීම මත 2008 වර්ෂයේ ශල්‍යකර්ම සිදු කිරීමට නොහැකි වූ හෘද රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(ii) 2005, 2006, 2007 වර්ෂවල මෙසේ ශල්‍යකර්මවලට යොමු කිරීමට නොහැකි වූ හෘද රෝගීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1161/’08

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,— කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) කෘෂිකර්ම සංවර්ධන අධිකාරිය ඇවර කිරීමේදී වන්දි ලබාගෙන සේවයෙන් ඉවත් නොවූ තනතුරු කාණ්ඩවල සහකාර අධ්‍යක්ෂ/කෘෂිකර්ම පර්යේෂණ හා ඵලදාවර්ධන නිලධාරීන් සම්බන්ධයෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් කෘෂිකර්ම හා පශු සම්පත් අමාත්‍යාංශයේ ලේකම් සහ කෘෂිකර්ම සංවර්ධන අධිකාරියේ ඇවරකරුටද පිටපත් සහිතව අය වැය අධ්‍යක්ෂ ජනරාල් අමතා අංක DMS/A සහ L 05 හා 2003.07.03 දිනැති ලිපියෙන් උපදෙස් ලබා දී ඇති (1), (11) යෝජනා එතුමා දන්නෙහිද?

(ආ) (i) එසේ නම්, එම යෝජනා ක්‍රියාත්මක කිරීමට දැනට ගෙන ඇති පියවර සහ ඉදිරිපත් කර ඇති සැලසුම්, යෝජනා කවරේද;

(ii) ඒවා ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වී ඇත්නම් එයට හේතු කවරේද;

(iii) ඉහත නිලධාරීන්ට කෘෂිකර්ම සංවර්ධන අධිකාරිය ක්‍රියාත්මක අවධියේ ලබා දී තිබූ වේතන, දීමනා හා අනෙකුත් පහසුකම් සපයාදී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම නිලධාරීන් ඉහත (අ) හි දැක්වෙන යෝජනාවන්ට අනුව රාජ්‍ය සේවයට අන්තර්ග්‍රහණය කිරීම සඳහා කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල පුරප්පාඩු හඳුනාගෙන තිබේද;

(ii) එසේ නම්, එම තනතුරු කාණ්ඩ සහ පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඈ) ඉහත සහකාර අධ්‍යක්ෂ/කෘෂිකර්ම පර්යේෂණ හා ඵලදාවර්ධන නිලධාරීන් රාජ්‍ය සේවයට අන්තර්ග්‍රහණය කර එම තනතුරු ලබාදීමට පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

1156/’08

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සතුව පැවති තලාව, මල්වානේගම ගොවිපල, පෞද්ගලික සමාගමකට ලබාදී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එසේ නම්, කවර පදනමකින්, කවර ආයතනයකට හෝ කවර පුද්ගලයෙකුට එම ගොවිපල ලබාදී තිබේද;

(ii) අදාළ ගොවිපල එම ආයතනයට පැවරීමේදී අක්කරයක් සඳහා වාර්ෂිකව ලබාගන්නා මුදල කොපමණද;

(iii) බදු දුන් දිනයේ සිට 2007 වර්ෂය දක්වා ලබාගෙන ඇති බදු මුදල කොපමණද;

(iv) ස්ථාවර මුදලක් ලබාගෙන තිබේනම් ඒ කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත ගොවිපල බඳු දෙන අවස්ථාවේ ගොවිපල සතුව පැවති නිශ්චල හා චංචල දේපලවල වටිනාකම කොපමණද;

(ii) එම දේපල කවර කාර්යයක් සඳහා යොදවන ලද්දේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) ඉහත ගොවිපල කවර අරමුණකින් කෙදිනක ස්ථාපිත කරන ලද්දේද;

(ii) වත්මන් පාලනය විසින් එම ගොවිපල උක්ත අරමුණ වෙනුවෙන් මෙහෙයවන්නේද;

යන්න එතුමා මෙම සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

1157/'08

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ පොලිස් ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එක් එක් පොලිස් ස්ථානය සඳහා ලබා දී ඇති වාහන සංඛ්‍යාව කොපමණද;

(iii) ඒ අතුරින් ලබාදී ඇති යතුරුපැදි සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) එම වාහන සඳහා 2007 වර්ෂය තුළ ඉහත එක් එක් පොලිස් ස්ථානය වෙත ලබාදී ඇති ඩීසල් සහ පෙට්‍රල් ප්‍රමාණය කොපමණද;

(ii) ඉහත එක් එක් පොලිස් ස්ථානයෙහි ලියාපදිංචියෙන් වසර 05ක් ඉක්මවූ සහ ලියාපදිංචියෙන් වසර 05ක් නොඉක්මවූ වාහන සංඛ්‍යාව කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ඉතාමත් අබලි වාහන භාවිත කරන පොලිස් ස්ථාන සඳහා අවශ්‍ය වාහන සහ ප්‍රමාණවත් ඉන්ධන ලබාදීමට එතුමා අවශ්‍ය පියවර ගන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1158/'08

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) අනුරාධපුර තලාව හරහා කැකිරාව මාර්ගයේ, තලාව නගරයේ සිට එප්පාවල දෙසට අලුත්වැඩියා කරන ලද කිලෝමීටර් සංඛ්‍යාව කොපමණද;

(ii) එම අලුත්වැඩියාව සඳහා කොපමණද මුදලක් ඇස්තමේන්තු කරන ලද්දේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) ඉහත මාර්ග අලුත්වැඩියාව සඳහා ලැබුණු ටෙන්ඩර සංඛ්‍යාව කොපමණද;

(ii) අදාළ ටෙන්ඩරය පවරන ලද ආයතනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත මාර්ගය අලුත්වැඩියා කිරීමේදී අලුත්වැඩියා කරන ලද බෝක්කු සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(iii) මෙම මාර්ග අලුත්වැඩියා කිරීමේදී ABC යොදා සැකසීම සඳහා ඇස්තමේන්තු කරන ලද දුර ප්‍රමාණය කොපමණද;

(iv) ඇස්තමේන්තුගත දුර ප්‍රමාණයෙන් කොපමණ දුර ප්‍රමාණයක් ඉහත පරිදි සකස් කරන ලද්දේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඈ) (i) ඉහත පාර සැකසීම නියමිත ප්‍රමිතියට සිදුකර තිබේද;

(ii) නියමිත ප්‍රමිතියට සිදුකර නොමැති නම් ගනු ලබන ක්‍රියාමාර්ගය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) අලුත්වැඩියා කළ මෙම පාරේ සමහර ස්ථාන ගිලා බැස ඇති බව එතුමා පිළිගන්නෙහිද?

(ඊ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

## (2009 මැයි මස 06 වැනි බදාදා)

1206/'09

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) අමාත්‍යවරුන්ගේ හා කාර්ය මණ්ඩලයේ භාවිතය වෙනුවෙන් කුලියට හෝ බද්දට වාහන ලබාගෙන ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එසේ වාහන කුලියට හෝ බද්දට ගෙන තිබේනම්, 2008 වර්ෂය වෙනුවෙන් කොපමණ අමාත්‍යවරුන් සංඛ්‍යාවකගේ ප්‍රයෝජනය සඳහා කොපමණ වාහන සංඛ්‍යාවක් ලබාගෙන තිබේද;

(ii) අමාත්‍යවරුන්ගේ කාර්ය මණ්ඩල වෙනුවෙන් කුලියට හෝ බද්දට ලබාගෙන තිබෙන වාහන සංඛ්‍යාව කොපමණද;

(iii) 2008 වර්ෂයේදී එම වාහන වෙනුවෙන් ගෙවා ඇති මුදල කොපමණද;

(iv) අමාත්‍යවරුන් හා කාර්ය මණ්ඩල වෙනුවෙන් 2008 වර්ෂයේදී කොපමණ මුදලක් වැයවී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ඒ අනුව අති විශාල මුදලක් කුලී වශයෙන් ගෙවීමට සිදුවන බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1255/'09

ගරු අජිත් කුමාර මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ශ්‍රී ලංකාවේ මේ වන විට කුරුඳු වගා කර ඇති බිම් ප්‍රමාණය සහ කුරුඳු වගාකරුවන් සංඛ්‍යාව දිස්ත්‍රික්ක අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම කුරුඳු වවන්නන් අතර අක්කර 2ට අඩු, අක්කර 2ට වැඩි, අක්කර 5 ට වැඩි, අක්කර 10 ට වැඩි සහ අක්කර 50 ට වැඩි ආදී වශයෙන් වූ වගාකරුවන් විසින් වවනු ලබන ඉඩම් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ශ්‍රී ලංකාව තුළ කුරුඳු තලන්නන්, කුරුඳු ව්‍යාපාරිකයින් සංඛ්‍යාව දිස්ත්‍රික්ක අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාව තුළ කුරුඳු අපනයනකරුවන් සංඛ්‍යාව සහ එම පුද්ගලයන්ගේ හෝ ආයතනවල නම් කවරේද;

(ii) එකී අපනයනකරුවන් විසින් පසුගිය වසර 05 තුළ අපනයනය කරන ලද කුරුඳු ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2009 මැයි මස 07 වැනි බ්‍රහස්පතින්දා

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1159/'08

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) උතුරුමැද පළාත් සභාවේ කටයුතු සඳහා ඉදිකෙරෙමින් පවතින අමාත්‍යාංශ ගොඩනැගිලි සංකීර්ණයේ අදාළ ඉදිකිරීම් ආරම්භ කරන ලද වර්ෂය කවරේද;

(ii) ඉදිකිරීම් කටයුතු භාරදුන් ආයතනය කවරේද;

(iii) අදාළ ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(iv) ඇස්තමේන්තුගත මුදලින් කොපමණ මුදලක් ගෙවන ලද්දේද;

(v) එසේ ගෙවන ලද දිනය සහ ගෙවීමට ඉතිරි මුදල කොපමණද;

(vi) මුල් සැලැස්මට අනුව මෙම ගොඩනැගිල්ලේ මහල් සංඛ්‍යාව කොපමණද;

(vii) එහි සම්පූර්ණ වර්ග ප්‍රමාණය කොපමණද;

(viii) එම මුල් සැලැස්මට පරිබාහිරව නව මහලක් එකතු කරන ලද්දේද;

(ix) එසේ නම්, එම මහලේ වර්ග ප්‍රමාණය කොපමණද;

(x) එම මහල එකතු කිරීම සඳහා වෙන්කළ මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) ඉහත ගොඩනැගිල්ලේ වැඩ ආරම්භ කිරීමට හා අවසන් කිරීමට නියමිතව තිබූ, දිනයන් කවරේද;

(ii) දැනට පවත්නා තත්වය අනුව එම ගොඩනැගිල්ලේ වැඩ අවසන් කිරිමට නියමිතව ඇති දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1160/'08

ගරු විජිත රණවීර මහතා,— කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) සූරියවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත්, පානීය ජලය සපයන මහවැලි සංවර්ධන අධිකාරී බල ප්‍රදේශයට අයත් සූරියවැව වැව් රක්ෂිතයේ සිටින අනවසර පදිංචිකරුවන් සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම අනවසර පදිංචිකරුවන්ගෙන්, ජලාශයට එක්වන අපද්‍රව්‍ය නිසා පානීය ජලය ලබා ගන්නා ජලාශය අපිරිසිදු වන බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) වැව් රක්ෂිතයේ අනවසර පදිංචිකරුවන්ගේ නම, ලිපිනය, පවුලේ සාමාජික සංඛ්‍යාව සහ මේ දක්වා ඔවුන් අනවසරයෙන් පදිංචිවී සිටි කාලය, එක් එක් පවුලට අදාළව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) වීරවිල ගුවන් තොටුපල තැනීමේදී ඉඩම් අහිමිවන අයට දීමට නියමිතව තිබූ මහවැලි අධිකාරියේ ඉඩම් කට්ටි, අදාළ ගුවන් තොටුපල එම ස්ථානයේ ඉදිකරනු නොලබන බැවින් වැව් රක්ෂිතයේ අනවසර පදිංචිකරුවන්ට එකී ඉඩම් ලබා දෙන්නේද;

(iii) නොඑසේ නම්, ඔවුන්ට වාරි ඉඩම් සහ පදිංචියට ගොඩ ඉඩම් ලබා දෙන ස්ථානය සහ අදාළ වාරි සහ ගොඩ ඉඩමේ බිම් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) දීර්ඝ කාලයක් අනවසර පදිංචිකරුවන් විසින් උපයාගත් දේපල ඔවුන් ඉවත් කිරීමේදී අහිමිවන නිසා, වාණිජ වටිනාකම පදනම කරගෙන වන්දි ගෙවීමට කටයුතු කරන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

1168/'08

ගරු වජිර අබේවර්ධන මහතා,— උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) මෙවර ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ පූර්ණකාලීන පාඨමාලා හැදෑරීම සඳහා අයදුම්කර සිටි අවුරුදු 24ට වැඩි ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අතුරින් කොපමණ සංඛ්‍යාවකට පූර්ණකාලීන පාඨමාලා ලබාදී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එක් අයෙකුගෙන් රු. 250/- බැගින් ගෙන එහෙත් වයස අනුව පාඨමාලා සඳහා තෝරා නොගත්, එහෙත් අවුරුදු 24 ට වඩා වැඩි අයදුම්කරුවන්ගෙන් අදාළ ආයතනය උපයාගත් මුදල කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1170/'09

ගරු විජිත රණවීර මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2006, 2007 සහ 2008 වර්ෂ සඳහා හම්බන්තොට දිස්ත්‍රික්කයේ වාර්ෂිකව නිකුත් කර තිබෙන නව ජාතික හැඳුනුම්පත් සංඛ්‍යාව කොපමණද;

(ii) 2008 වර්ෂය අවසන් වනවිට දිස්ත්‍රික්කයට නිකුත් කර ඇති සම්පූර්ණ ජාතික හැඳුනුම්පත් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වයස අවුරුදු 16 සම්පූර්ණ වුවද, දිස්ත්‍රික්කය තුළ මේ දක්වා ජාතික හැඳුනුම්පත් ලබාගෙන නොමැති අය සිටින්නේද;

(ii) එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමෙන් එම සංඛ්‍යාව කොපමණද;

(iii) ඔවුන්ට ජාතික හැඳුනුම්පත් ලබා ගැනීමට නොහැකි වී ඇති බාධාවන් කවරේද;

(iv) එම බාධාවන් මඟ හරවා, හැඳුනුම්පත් නොමැති අයට හැඳුනුම්පත් ලබා දීමට අදාළ අමාත්‍යාංශය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) පරිගණකගත ජාතික හැඳුනුම්පත (e-NIC) ලබාදීම ආරම්භ කරන්නේ කවදාද;

(ii) එම හැඳුනුම්පතක් (e-NIC) ලබා ගැනීම සඳහා පුරවැසියෙකු විසින් දැරිය යුතු වියදම කොපමණද;

(iii) දෙපාර්තමේන්තුවේ කටයුතු, ප්‍රාදේශීය ලේකම් කාර්යාල දක්වා විමධ්‍යගත කිරීමේ ප්‍රගතිය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1171/'09

ගරු විජිත රණවීර මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) රුපියල් 1,230,000/= ක වෙළඳපොළ වටිනාකමක් සහිත, 2000 වර්ෂයේ නිෂ්පාදිත අංක 227–5808 දරන ජල බවුසරය, හම්බන්තොට ප්‍රාදේශීය සභාවට අයත් එකක් බව එතුමා දන්නෙහිද?

(ආ) (i) සුනාමි ව්‍යසනයට හසුවී අබලන්ව තිබූ එම ජල බවුසරය අලුත්වැඩියා කිරීම සඳහා වියදම් කරන ලද සම්පූර්ණ මුදල කොපමණද;

(ii) මෙම බවුසරය අලුත්වැඩියා කිරීමේදී අදාළ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් ආර්ථික වාසිය, වාහනයේ සේවා කාලය සහ තත්වය සැලකිල්ලට ගෙන කටයුතු කර තිබේද;

(iii) මහජන මුදල් අරපිරිමැසුම්දායක ලෙස හා කාර්යක්ෂමව යෙදවීමට අදාළ සභාපතිවරයා කටයුතු කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ඉහත කරුණ පිළිබඳව විධිමත් පරීක්ෂණයක් සිදුකර තිබේනම් අදාළ පරීක්ෂණ වාර්තා එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඈ) (i) ඉහත කරුණට අදාළව පවත්නා නීතියට පටහැනිව කටයුතු කර ඇති පුද්ගලයින්ගේ නම් සහ තනතුරු කවරේද;

(ii) චෝදනා ලැබූ පුද්ගලයන් සම්බන්ධයෙන් ගනු ලැබූ විනයානුකූල ක්‍රියාමාර්ග කවරේද;

(iii) අයථා ලෙස පරිහරණය කරනු ලැබූ මුදල් නැවත අදාළ ප්‍රාදේශීය සභාවට අයකර ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

1173/’09

ගරු තිලකරත්න විතානාච්චි මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ගාල්ල, නාගොඩ, පරණතානායම්ගොඩ කණිටු විද්‍යාලය ආරම්භ කරන ලද වර්ෂය කවරේද;

(ii) මෙම පාසලට අයත් භූමිය පරිත්‍යාග කරන ලද්දේ කවුරුන් විසින්ද;

(iii) මෙම පාසල වසා දමා කොපමණ කාලයක් ගතවී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) හිටපු ආණ්ඩුකාරවරයෙකු වන එම්. එස්. අමරසිරි මහතා ඇතුළු විශාල උගතුන් පිරිසක් රටට දායාද කිරීමට මෙම පාසල මූලික වූ බවත්;

(ii) මෙම පාසල වසාදැමීම නිසා අඩු ආදායම්ලාභී දෙමව්පියන්ට අධික මුදලක් ගෙවා පාසල් වෑන් රථවලින් ආසන්න පාසල්වලට තම දරුවන් යැවීමට සිදුවී ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) ගොඩනැගිලි ඇතුළු පහසුකම් සහිත මෙම පාසලට තම දරුවන් එවීමට දෙමව්පියන් සූදානම් බැවින්, අවශ්‍ය ගුරුවරුන් ලබාදී කොපමණ කාලයක් තුළ මෙම පාසල විවෘත කිරීමට එතුමා පියවර ගන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1202/’09

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2008 දෙසැම්බර් මස 31 වැනි දිනට ශ්‍රී ලංකාවේ ලියාපදිංචි මෝටර් රථ සංඛ්‍යාව කොපමණද;

(ii) එම වාහන අතුරින් ඩීසල් වාහන සහ පෙට්‍රල් වාහන සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ලියාපදිංචි මුළු පෙට්‍රල් වාහන අතුරින් යතුරුපැදි, ත්‍රීරෝද රථ සහ වෙනත් වාහන සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) සම්පූර්ණ පෙට්‍රල් අලෙවියෙන් , යතුරු පැදි සහ ත්‍රීරෝද රථ සඳහා කවර ප්‍රතිශතයක් වෙන් වෙන් වශයෙන් අලෙවි වන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) පෙට්‍රල් මිල අඛණ්ඩව ඩීසල් මිලට වඩා වැඩි අගයක් ගැනීම හේතුවෙන් ත්‍රීරෝද රථ සහ යතුරුපැදිවල ගමන් ගන්නා මගීන් දැඩි අපහසුතාවයකට පත්වන බව එතුමා පිළිගන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1203/’09

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) රණවිරුවන් සඳහා නිවාස 50,000ක් ඉදිකිරීමේ ව්‍යාපෘතියක් ආරම්භකර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම රණවිරු නිවාස ඉදිකිරීම ආරම්භ කරන ලද්දේ කවදාද;

(ii) මෙම නිවාස ඉදිකිරිම ආරම්භකර ඇත්නම් කවර ස්ථානයක කොපමණ සංඛ්‍යාවක වැඩ ආරම්භකර තිබේද;

(iii) වැඩ අවසන් කර ඇති නිවාස සංඛ්‍යාව කොපමණද;

(iv) රණවිරුවන් වෙත ලබාදී ඇති නිවාස සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් වෙන්කර ඇති මුදල කොපමණද;

(ii) වැයකර ඇති මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) රණවිරුවන් සඳහා නිවාස ඉදිකරන ව්‍යාපෘතිය ඉතාමත් මන්දගාමීව සිදුවන බව එතුමා පිළිගන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

1257/'09

ගරු ප්‍රේමසිරි මානගේ මහතා,— ධීවර හා ජලජ සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2008 වර්ෂය තුළ ධීවර වරායන් ඉදිකිරීම සඳහා මුල්ගල් තැබීමක් සිදුකර තිබේද;

(ii) එසේනම් එම ස්ථාන සහ අදාළ දිනයන් කවරේද;

(iii) මුල්ගල් තැබීම සිදුකළ ස්ථානවල ඉදිකිරීම් කටයුතු ආරම්භ කර තිබේද;

(iv) එසේනම් ඒ කවර ස්ථාන වලද;

(v) අදාළ ඉදිකිරීම් කටයුතු ආරම්භ කළේ කවදාද;

(vi) මේ වන විට එම ඉදිකිරීම් කටයුතුවල ප්‍රගතිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1238/'09

ගරු ප්‍රේමසිරි මානගේ මහතා,— මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) ත්‍රිකුණාමලය - නිලාවැලි හරහා මාර්ගයක් ඉදිකෙරෙමින් පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත මාර්ගයේ දිග හා පළල කොපමණද;

(ii) එකී මාර්ගයට අදාළව ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(iii) ඊට අදාළව මූල්‍ය පහසුකම් ලැබෙන්නේ කෙසේද;

(iv) එම මාර්ගය නම්කර තිබෙන්නේ කවර නමකින්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1239/'09

ගරු ජේමසිරි මානගේ මහතා,— ධීවර හා ජලජ සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ලංකා ධීවර සංස්ථාව 2000 වර්ෂයේ සිට මේ දක්වා ලබා තිබෙන ලාභය හෝ පාඩුව කොපමණද;

(ii) පාඩුවක් ලබා තිබේනම් ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම පාඩුව ලාභයක් බවට පත් කිරීම සඳහා මේ වන විට ගෙන තිබෙන ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2009 මැයි මස 19 වැනි අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1208/'09

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) දිවයිනේ සියලුම පාසැල්වල සේවය කරන දෙමළ මාධ්‍ය ගුරුවරු සංඛ්‍යාව කොපමණද;

(ii) දෙමළ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලබන ළමුන් සංඛ්‍යාව කොපමණද;

(iii) දෙමළ මාධ්‍ය පාසල්වල සේවය කරන උපාධිධාරී ගුරුවරුන් සංඛ්‍යාව කොපමණද;

(iv) ඔවුන් අතුරින් කලා, වාණිජ, විද්‍යා සහ වෙනත් උපාධිධාරී ගුරුවරු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) උපාධිය සඳහා දෙමළ විෂයය හදාරා තිබෙන ගුරුවරු සංඛ්‍යාව කොපමණද;

(vi) මෙම ගුරුවරු අතුරින් ඉංග්‍රීසි මාධ්‍යයෙන් හෝ ඉංග්‍රීසි විෂයයක් වශයෙන් උපාධිය සඳහා හදාරා තිබෙන ගුරුවරුන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මෙම පාසල්වල ප්‍රමාණවත් උපාධිධාරීන් සංඛ්‍යාවක් සේවය නොකරන බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1210/'09

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— ඛනිජ තෙල් හා ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ඉන්දියානු I.O.C සමාගම විසින් මෙරට ඛනිජ තෙල් අලෙවිය ආරම්භ කරන ලද්දේ කවදාද;

(ii) මෙම සමාගම විසින් 2007, 2008 යන වර්ෂවල ලංකා ඛනිජ තෙල් සංස්ථාවෙන් මිලදී ගෙන තිබෙන පෙට්‍රල් හා ඩීසල් ප්‍රමාණය කොපමණද;

(iii) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ඉහත පෙට්‍රල් හා ඩීසල් අලෙවියෙන් ලබාගෙන ඇති මුදල කොපමණද;

(iv) I.O.C සමාගම විසින් මෙරටට පෙට්‍රල් හා ඩීසල් ආනයනය කළේද;

(v) එසේ නම්, 2007 සහ 2008 වර්ෂවල ආනයනය කරන ලද තෙල් ප්‍රමාණය කොපමණද;

(vi) එසේ ආනයනික තෙල් වලින් බදු අයකරන ලද්දේද;

(vii) එලෙස බදු අය කළේ නම්, පාරිභෝගිකයා විසින් තෙල් මිලදී ගන්නා තෙක් අයකරන ලද බදු කවරේද;

(viii) ඩීසල් සහ පෙට්‍රල් ලීටරයක් සඳහා අයකරන ලද බදු මුදල් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත සමාගමෙන් 2007 සහ 2008 වර්ෂවලදී අයකර ගෙන ඇති බදු මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) දිවයිනේ සම්පූර්ණ තෙල් අලෙවියෙන් කවර ප්‍රතිශතයක් මෙම සමාගම විසින් අලෙවි කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1211/'09

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) රජයේ රෝහල්වල ප්‍රයෝජනය සඳහා 2007 සහ 2008 වර්ෂවලදී මිලදී ගන්නා ලද ඖෂධ හා උපකරණවල වටිනාකම කොපමණද;

(ii) එම ඖෂධ හා උපකරණ වලින් කොපමණ ප්‍රමාණයක් කල් ඉකුත්වූවා සේ සලකා ඉවත් කරන ලද්දේද;

(iii) ඒ ඒ වර්ෂවලට අදාලව ඒවායේ වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) 2007 සහ 2008 වර්ෂ තුළදී මිලදී ගත් ඖෂධ හා උපකරණ අතුරින් කොපමණ ප්‍රමාණයක් අදාළ ප්‍රමිතීන්ට අනුකූල නොවීම හේතුවෙන් භාවිතයෙන් ඉවත් කරන ලද්දේද;

(v) එලෙස භාවිතයෙන් ඉවත් කරන ලද ඖෂධ කවරේද;

(vi) එම ඖෂධවල ප්‍රමාණය හා වටිනාකම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) භාවිතයෙන් ඉවත් කරන අවස්ථාවේ ඉහත ඖෂධ හා උපකරණ අතුරින් කොපමණ ප්‍රමාණයක් පාවිච්චිකර තිබේද;

(ii) නිසි ප්‍රමිතියෙන් තොර ඖෂධ භාවිතය හා මිලදී ගැනීම පාලනය කිරීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1240/'09

ගරු ප්‍රේමසිරි මානගේ මහතා,— වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යතුමා සහ වරාය හා ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) "මිහින් ලංකා" ගුවන් සේවය සඳහා 2008, 2009 වර්ෂවල අයවැයෙන් වෙන්කළ මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) එම ගුවන් සේවයට අමතරව රජයට අනුබද්ධ තවත් ගුවන් සේවයක් තිබේද;

(iii) එසේ නම්, එහි නම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මිහින් ලංකා ගුවන් සේවය සතු ගුවන් යානා සංඛ්‍යාව කොපමණද;

(ii) එම ගුවන් යානාවල ලියාපදිංචි අංකයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) පසුගිය වර්ෂය තුළ මිහින් ලංකා ගුවන් සේවය ලැබූ ලාභය හෝ අලාභය කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1242/'09

ගරු පේමසිරි මානගේ මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) 2009 අයවැයෙන් අතිගරු ජනාධිපතිතුමාගේ වැය ශීර්ෂය වෙනුවෙන් වෙන්කළ මුදල් ප්‍රමාණය කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2009 අයවැයෙන් "ධීවර" වැය ශීර්ෂය සඳහා වෙන්කළ මුදල කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) "ධීවර" වැය ශීර්ෂය සඳහා අයවැයෙන් වෙන්කළ මුදල ප්‍රමාණවත් නොවන බව එතුමා පිළිගන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1244/'09

ගරු පේමසිරි මානගේ මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) 2009 අයවැයෙන් සමෘද්ධි සහනාධාරය සඳහා වෙන්කළ මුදල කොපමණද යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) සමෘද්ධි සහනාධාරය සඳහා 2009 අයවැයෙන් වෙන්කළ මුදල ප්‍රමාණවත් නොවන බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1272/'09

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා,— සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) 2007.07.03 දින පාර්ලිමේන්තුවේදී අසන ලද ප්‍රශ්නයට පිළිතුරු වශයෙන්, රත්නපුර මහ රෝහලේ දී 2002.08.28 දින දී සිදු කරන ලද ශල්‍යකර්මයෙන්, එච්. ආර්. එම්. බී .පී. ගම්භාරවත්ත මහතාගේ වම් අතේ 05 වැනි ඇඟිල්ල සම්පූර්ණයෙන්ද, 04 වැනි ඇඟිල්ලේ පුරුක් දෙකක්ද ඉවත් කර ඇති බව සඳහන් කල බව එතුමා දන්නෙහිද?

(ආ) වැරදි ලෙස ප්‍රතිකාර කිරීම මත ඇඟිල්ලක් සහ තවත් ඇඟිල්ලක පුරුක් දෙකක් ඉවත් කිරීම සම්බන්ධයෙන් විමර්ශන හා හදිසි වැටලීම් අංශය මගින් විමර්ශනය කර අදාළ වාර්තාව විශේෂඥ වෛද්‍ය මණ්ඩලය වෙත යොමු කිරීමෙන් පසු එම නිර්දේශය එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) එම නිර්දේශ මත, වෛද්‍යවරුන්ගෙන් සිදුවූ ප්‍රමාදයන් නම් අදාළ රෝගියාට ඒ සඳහා සාධාරණ වන්දියක් ලබාදීමට එතුමා අවශ්‍ය පියවර ගන්නෙහිද?

(ඈ) එසේ නම්, අදාළ වන්දිය ලබා දෙන්නේ කවදාද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

1435/'09

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— සංස්කෘතික කටයුතු හා ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) කොළඹ නිදහස් අනුස්මරණ කෞතුකාගාරය විවෘත කළ දිනය කවදාද;

(ii) එය ඉදිකිරීම සඳහා වැය කළ සම්පූර්ණ මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) විවෘත කිරීමෙන් පසු, එහි විදුලිය විසන්ධි කළ අවස්ථා තිබේද;

(ii) විදුලිය විසන්ධි කිරීම නිසා ඉහත කෞතුකාගාරය වසා දැමූ දිනයන් කවරේද;

(iii) නියමිත පරිදි විදුලි බිල ගෙවීමට අසමත් වී ඇත්තේ කවර හේතු නිසාද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1436/'09

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) කොට්ටාව නගරයේ අලුතෙන් මාර්ග සංඥා පද්ධතියක් සවි කළේ කවදාද;

(ii) ඉහත සංඥා පද්ධතිය නියමිත පරිදි ක්‍රියාත්මක නොවී කහපාට බල්බය පමණක් දැල්වෙමින් පවතින්නේ කවර හේතුවක් නිසාද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම මාර්ග සංඥා පද්ධතිය ක්‍රියාත්මක කිරීමට වැය කළ සම්පූර්ණ මුදල කොපමණද;

(ii) එය ඉදිකරන ලද ඉදි කිරීම් ආයතනය කවරේද;

(iii) සම්පූර්ණ ගෙවීම් සිදු කර අවසන්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2009 මැයි මස 20 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1204/'09

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යතුමා සහ ව්‍යවසාය සංවර්ධන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) ස්වාධීන රූපවාහිනිය මගින් 2005, 2006, 2007 සහ 2008 වර්ෂවලදී මැතිවරණ පූර්ව ප්‍රචාරක දැන්වීම් ප්‍රචාරණය කරන ලද බව එතුමා දන්නෙහිද?

(ආ) එසේ පූර්ව මැතිවරණ ප්‍රචාරක කටයුතුවල යෙදීමෙන් ඒ ඒ දේශපාලන පක්ෂවලින් ආයතන හා පුද්ගලයින්ගෙන් එක් එක් වර්ෂයේදී ඉහත ආයතනය උපයාගෙන ඇති මුදල කොපමණද යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත පූර්ව මැතිවරණ කටයුතුවල යෙදීම හේතුවෙන් අයකර ගැනීමට ඇති මුදල කොපමණද;

(ii) ඒ කවර පක්ෂයකින්, කවර ආයතනයකින් සහ කවර පුද්ගලයෙකුගේ ප්‍රචාරක කටයුතු වෙනුවෙන්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1258/’09

ගරු ජේමසිරි මානගේ මහතා,— ධීවර හා ජලජ සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2008 වර්ෂය තුළ නැංගුරම්පොළ කිහිපයක් ඉදිකිරීම සඳහා මුල්ගල් තැබීමක් සිදුකර තිබේද;

(ii) එසේනම් එම මුල්ගල් තැබීම සිදුකර තිබෙන ස්ථාන කවරේද;

(iii) අදාළ මුල්ගල් තැබීම සිදුකළේ කවදාද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත මුල්ගල් තැබීම සිදුකළ ස්ථානවල මේ වනවිට ඉදිකිරීමේ කටයුතු ආරම්භකර තිබේද;

(ii) එසේ නම්, ඒ කවර ස්ථානවලද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1259/’09

ගරු ජේමසිරි මානගේ මහතා,— ධීවර හා ජලජ සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ධීවර කාර්මිකයින් සඳහා විශ්‍රාම වැටුප් ක්‍රමයක් ක්‍රියාත්මක වන්නේද;

(ii) ධීවරයින් එම විශ්‍රාම වැටුප් ක්‍රමයට දායකවීමේදී ගෙවිය යුතු මූල්‍ය ප්‍රතිශතය කොපමණද;

(iii) මේ වනවිට විශ්‍රාම වැටුප් ලබන ධීවරයින් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත විශ්‍රාම වැටුප් සඳහා රජයෙන් මූල්‍ය දායකත්වයක් ලබාදෙන්නේද;

(ii) එසේ නම්, ඒ කොපමණ මූල්‍ය ප්‍රතිශතයක්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2009 මැයි මස 21 වැනි බ්‍රහස්පතින්දා
## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1260/’09

ගරු ජේමසිරි මානගේ මහතා,— ධීවර හා ජලජ සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2008 වර්ෂය තුළ ලෝන්ලයින් පන්නය සඳහා රජය මගින් ධීවරයින්ට සහන ලබාදී තිබේද;

(ii) එසේ නම්, එක් එක් දිස්ත්‍රික්කය අනුව එලෙස සහන ලබාදී ඇති ධීවරයින් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ලෝන්ලයින් පන්න ක්‍රමයට ධීවරයින් යොමු කිරීම සඳහා ගෙන තිබෙන ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1262/'09

ගරු ජේමසිරි මානගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) සුනාමියෙන් දෙමාපියන් හෝ භාරකරුවන් අහිමි වී ඇති දරුවන්ගේ වියදම් දැරීම සඳහා විශේෂ අරමුදලක් පිහිටුවන බවට "මහින්ද චින්තනයේ" සඳහන් වන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එකී විශේෂ අරමුදල පිහිටුවනු ලැබුවේ නම් ඒ කවදාද;

(ii) එම අරමුදලෙන් සහන ලබාදී ඇති දරුවන් සංඛ්‍යාව කොපමණද;

(iii) ඒ සඳහා වැය කර ඇති මුදල් ප්‍රමාණය කොපමණද;

(iv) එම විශේෂ අරමුදලෙන් සහන ලබා දී තිබෙන දරුවන්ගේ නම් හා ලිපිනයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1263/'09

ගරු ජේමසිරි මානගේ මහතා,— ධීවර හා ජලජ සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2009 අයවැයෙන් ධීවර ජනතාවට සහන ලබා දී තිබේද;

(ii) එම සහන කවරේද;

(iii) එම සහන ක්‍රියාත්මක වන්නේ කවදා සිටද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2009 මැයි මස 22 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1264/'09

ගරු ජේමසිරි මානගේ මහතා,— ධීවර හා ජලජ සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2008 ජනවාරි මාසයේ සිට මේ දක්වා කාලය තුළ කොපමණ වැව් හා ජලාශ ප්‍රමාණයක මත්ස්‍ය වගා කටයුතු ආරම්භකර තිබේද;

(ii) ඒ කවර වැව් හා ජලාශවලද;

(iii) ඒවායේ වගා කළ මසුන් වර්ග කවරේද;

(iv) එම වැව් හා ජලාශවල මත්ස්‍ය වගාවේ නිෂ්පාදනය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1265/'09

ගරු ජේමසිරි මානගේ මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) ජපානයේ විශේෂ සාම නියෝජිත යෂුසි අකාසි මහතා ශ්‍රී ලංකාවට පැමිණ තිබෙන වාර සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඒ මහතා ශ්‍රී ලංකාවට පැමිණි දිනයන් සහ එලෙස පැමිණියේ කවර කටයුතු සඳහාද;

(ii) ඒ මහතා ශ්‍රී ලංකාවට පැමිණ සාකච්ඡා පැවැත්වූ අයගේ නම් හා ලිපිනයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1267/'09

ගරු ප්‍රේමසිරි මානගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) වර්තමාන අතිගරු ජනාධිපතිතුමාගේ උපදේශකවරුන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම උපදේශකවරුන්ගේ නම් හා ලිපිනයන් කවරේද;

(iii) එම උපදේශකවරුන්ට ලබා දී තිබෙන වරප්‍රසාද කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත උපදේශකවරුන්ගේ සංඛ්‍යාව අඩු කළ යුතු බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# දින නියමයක් නොමැති යෝජනා පිළිබඳ දැනුම්දීම

*

ආපදා කළමනාකරණ හා මානව හිමිකම් අමාත්‍යතුමා,— 1996 අංක 21 දරන පනත යටතේ ස්ථාපනය කරනු ලැබූ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ක්‍රියාකාරීත්වය සමාලෝචනය කිරීම සඳහා පෙර පැවති විශේෂ කාරක සභාවේ කාර්යභාරය අඛණ්ඩව පවත්වාගෙන යාම හා එම කාර්යභාරය පූර්ණත්වයට පත් කරනු වස් පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව ,—

"1996 අංක 21 දරන පනත යටතේ ස්ථාපනය කරනු ලැබූ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ක්‍රියාකාරීත්වය සමාලෝචනය කිරීම සඳහාත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XVI වැනි පරිච්ඡේදය යටතේ, නීති පැනවීමට පෙර ඒවා සමාලෝචනය කිරීමට අදාළව ශ්‍රේෂ්ඨාධිකරණය සතුව ඇති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය අධිකරණ බල ක්ෂේත්‍රය නිර්ණය කරන්නා වූ විධිවිධානයන්හි ඵලදායී බව තක්සේරු කිරීම සඳහාත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන හා අනුකූල වන බවට සහතික වීමේ විකල්ප ක්‍රම සලකා බැලීම සඳහාත්, එකී සමාලෝචනවල විෂය පථය පුළුල් කිරීම සලකා බැලීම සඳහා සහ අවශ්‍ය අවස්ථාවන්හි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සංශෝධන යෝජනා කිරීම සඳහාත්, 2002 අප්‍රේල් මස 10 වැනි දින පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් වූ හෙයින් ද,

එසේම එකී පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව එතෙක් නිරතව සිටි කාර්යයන් සනිටුහන් කරමින් සහ ස්වකීය ඉදිරි පියවර සඳහා වැඩසටහන් පැහැදිලි කර දෙමින් 2002 දෙසැම්බර් මස 10 දිනැති අතුරු වාර්තාවක් ඉදිරිපත් කළ හෙයින් ද,

එසේ වුවද, 2004 අප්‍රේල් මස පාර්ලිමේන්තුව විසුරුවා හැරීම හේතුකොටගෙන, එකී පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවේ ද්විත්ව බලාධිකාරය පූර්ණත්වයට පත්කිරීමට අපොහොසත්වූ හෙයින් ද,

පෙර පැවති විශේෂ කාරක සභාවේ කාර්යභාරය අඛණ්ඩව පවත්වාගෙන යාම හා එම කාර්යභාරය පූර්ණත්වයට පත් කරනු වස් පහත සඳහන් නිර්ණය විෂය (Terms of Reference) ඉටු කිරීම පිණිස ද ,

(අ) 1996 අංක 21 දරන පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකාවේ මානව හිමිකම් කොමිසමේ ක්‍රියාකාරීත්වය සමාලෝචනය කිරීමටත් එහි සඵලතාව වර්ධනය කිරීමේ ක්‍රමෝපායන් යෝජනා කිරීමටත්, එකම කාර්යය නැවත කිරීමට සිදු වීමේ අවස්ථා අඩු කිරීමටත් මානව හිමිකම් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම උදෙසා ආයතනයේ භූමිකාව සහ බලාධිකාරය ශක්තිමත් කිරීමේ පරමාර්ථය ඇතිව එකී නීතිය සංශෝධනය කිරීමට, සහ

(ආ) නීතියේ පූර්ව නීති පැනවීම සමාලෝචනයට සම්බන්ධව, ව්‍යවස්ථාවේ විධිවිධානයන්හි සඵලතාව තක්සේරු කිරීමට සහ ව්‍යවස්ථාවේ XVI පරිච්ඡේදය යටතේ ශ්‍රේෂ්ඨාධිකරණයේ ව්‍යවස්ථාමය අධිකරණ බල සීමාවේ භාවිතය උදෙසා ව්‍යවස්ථාමය විධිවිධාන සමඟින් සහතික වීමේ අනුකූලතා විකල්ප ක්‍රමයන් සමාලෝචනය කිරීමට එවැනි සමාලෝචනයෙහි විෂය පථය පුළුල් කිරීම සලකා බැලීමට අවශ්‍යතාව ඇති විටක ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සඳහා යෝජනා කිරීමට,

පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත්කිරීමට මෙම ගරු සභාව නිශ්චය කරයි."

(2.) (අ) එම කාරක සභාව සහ එහි සභාපතිවරයා කථානායකතුමා විසින් නම් කරනු ලැබිය යුතු ය.

(ආ) ස්ථාවර නියෝග 95 හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, මෙම කාරක සභාව සාමාජිකයින් විසි එක් (21) දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත විය යුතු ය.

(3.) ඒ කාරක සභාවට,—

(අ) සිය ගණපූරණය නියම කර ගැනීමට බලය තිබිය යුතු ය.

(ආ) කාරක සභාව ඉදිරියේ පෙනී සිටින ලෙස යම් තැනැත්තකු කැඳවීමට ද, යම් ලේඛනයක් හෝ වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස යම් තැනැත්තකුට නියම කිරීමට ද, ඉහත සඳහන් කරුණු පූර්ණ ලෙස සලකා බැලීම පිණිස අවශ්‍ය යයි කාරක සභාව කල්පනා කරන ලිඛිත හෝ වාචික සියලු සාක්ෂි ලබා ගැනීමට හා භාර ගැනීමට ද බලය තිබිය යුතු ය.

(ඇ) කාරක සභාව වෙත සහාය ලබා ගැනීම පිණිස අදාල ක්ෂේත්‍රයන්හි විශේෂඥයන්ගේ සහ ප්‍රවීණයන්ගේ සේවාවන් ලබා ගැනීමට ද බලය තිබිය යුතු ය.

(ඈ) කලින් කලට වාර්තා කිරීමට සහ පාර්ලිමේන්තුව අඩාලව කල් තබන ලද්දේ වුව ද, රැස්වීම් පවත්වාගෙන යෑමට ද බලය තිබිය යුතු ය.

(4.) සියලුම කරුණු සැලකිල්ලට භාජනය කිරීමෙන් අනතුරුව, කාරක සභාව පත්කර මාස හයක් (06) ඇතුළත හෝ පාර්ලිමේන්තුවේ අභිමතය පරිදි නියම කරනු ලබන පසු දිනයක හෝ වාර්තාව ඉදිරිපත් කළ යුතු ය.

පා.48/'09

ගරු ආර්. එම්. පද්ම උදය ශාන්ත ගුණසේකර මහතා
ගරු සමන්සිරි හේරත් මහතා
ගරු පියසිරි විජේනායක මහතා
ගරු අන්ජාන් උම්මා මහත්මිය
ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි
ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
ගරු හේමකුමාර නානායක්කාර මහතා
ගරු පාඨලී චම්පික රණවක මහතා
ගරු (පූජ්‍ය) අක්මීමන දයාරතන හිමි
ගරු එන්. ඩී. එන්. පී. ජයසිංහ මහතා
ගරු දීපාල් ගුණසේකර මහතා
ගරු මොහොමඩ් මුසම්මිල් මහතා
ගරු සරත් කුමාර ගුණරත්න මහතා
ගරු පවිත්‍රා දේවි වන්නිආරච්චි මහත්මිය
ගරු ගීතාංජන ගුණවර්ධන මහතා

ගරු (පූජ්‍ය) එල්ලාවල මේධානන්ද හිමි,— ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන පිටි කිරි ජාත්‍යන්තර ප්‍රමිතියට අනුකූලදැයි සොයා බැලීම සඳහා වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව,— ශ්‍රී ලංකාවේ වෙළෙඳපොළ තුළ ඇති ආනයනික පිටි කිරි හි අඩංගුව, සංයුතිය, ඇසුරුම හා ප්‍රචාරණය ජාත්‍යන්තර පිළිගත් සම්මතයන් හි නීති රෙගුලාසිවලට අදාළව සිදුවන්නේ ද යන්න ගැන සමස්ත ශ්‍රී ලාංකීය ජනයා අතර ප්‍රශ්නයක් බවට පත් ව ඇති හෙයින් ද; ලොව සුපතල පිටි කිරි නිෂ්පාදනය හා වෙළඳාම් කිරීමට මේ සමාගම් අධික ලාභය සඳහා මිනිස් ජීවිතවලට ඉතාමත් අහිතකර රසායනිකයන් අඩංගු කර පිටි කිරි හා සමානකමින් යුත් වෙනත් නිෂ්පාදන පිටි කිරි මෙන් විකිණීම ඉතා ප්‍රචලිත කරුණක් හෙයින් ද; පසුගිය වර්ෂය තුළ මීන් එක් සමාගමක් චීනය තුළ දී ළදරු පිටි කිරි වලට 'මෙලමයින්' නම් උග්‍ර විෂ රසායනිකය මුසු කොට තිබීම නීතිය ඉදිරියේ සනාථ වූ බැවින් චීන රාජ්‍ය නීති ඒජන්සිය මගින්, එම සමාගම් නිලධාරීන් දෙදෙනෙකුට මරණ දණ්ඩනය නියම කොට බොහෝ නිලධාරීන් ප්‍රමාණයක් සිර ගත කළ හෙයින් ද;

මේ තත්ත්වය ගැන සැලකීමේදී, අද දවසේ ශ්‍රී ලංකාව තුළ ද පිටි කිරි ප්‍රධාන ආහාරයක් බවට පත් වී ඒ තුළින් ආනයනික පිටි කිරි සඳහා විශාල වෙළෙඳපොලක් නිර්මාණය වී ඇති හෙයින් ද, මෙම වෙළෙඳපොළ ගොඩනැඟීම් සඳහා අති දැවැන්ත ප්‍රචාරක මාධ්‍ය තුළින් පිටි කිරි හි සංයුතිය ගැන වැරදි හා බොරු ප්‍රචාර කරමින් ජනතාව රවටා එම පිටි කිරි අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යයක් බවට ජන මනස තුළ ඇති කරන ක්‍රියාවලිය තුළ ලංකාවේ ආනයනික පිටි කිරි වල තත්ත්වය කෙසේ දැයි සත්‍ය වශයෙන් සොයා බලා කටයුතු කිරීමට, රටේ ජනතාවගේ පරමාධිපත්‍යයේ හා නීති සම්පාදනයේ ප්‍රධාන ආයතනයේ නියෝජිතයන් වන අපගේ යුතුකමක් වන හෙයින් ද;

මෙම තත්ත්වය සැලකිල්ලට ගෙන ඒ පිළිබඳව ක්‍රමවත්ව විමර්ශනය කර සොයා බලා, රජයට හා ඒ පිළිබඳව ක්‍රියාකරන සියලුම ආයතන/පුද්ගලයන්ට අවශ්‍ය නීති, නිර්දේශයන් හා විසඳුම් සොයා බලා ඉදිරිපත් කිරීම සඳහා පහත සඳහන් කාරණා සැලකිල්ලට ගතයුතු බවට යෝජනා කරමු.

(අ) (i) ශ්‍රී ලංකාවේ පිටි කිරි ආනයනය කරන්නේ කවුරුන් විසින් දැයි දැන ගැනීම සඳහාත්;

(ii) එක් එක් ආනයනකරුවන් විසින් ආනයනය කරන ලද පිටි කිරි වර්ග, ප්‍රමාණය හා නිෂ්පාදනය කරන ලද රට කුමක්ද යන්න දැන ගැනීම සඳහාත්;

(ආ) (i) මෙම එක් එක් ආනයනකරුවන් විසින් ආනයනය කරන ලද පිටි කිරි වල අඩංගුව, සංයුතිය, ඇසුරුම ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල ද යන බව සොයා බැලීම සඳහාත්;

(ii) මෙම ආනයන පිටි කිරි ජාත්‍යන්තර සෞඛ්‍ය ආරක්ෂක නීති වලට අනුකූල ද යන බව සොයා බැලීම සඳහාත්;

(ඇ) (i) මෙම ආනයනික පිටි කිරි ආනයනකරුවන් වෙළෙඳ හා අලෙවි සමාගම් විසින් පිටි කිරි වල සංයුතිය හා පෝෂණය ගැන අතිශයෝක්තියෙන් හා/හෝ වැරදි චිත්‍රයක් මැවීම තුළින් ජනතාව රැවටීමට භාජනය වීමක් හා/හෝ අඩංගුව පිළිබඳ වැරදි ප්‍රකාශනයක් කිරීම තුළින් හා/හෝ තම නිෂ්පාදන ජනතාවගේ මනස තුළට කාවැද්දවීම සඳහා ඉලෙක්ට්‍රෝනික, මුද්‍රිත, පත්‍රිකා, පෝස්ටර්, බැනර් හා නාම පුවරු භාවිතා කරන්නේද යන්න සොයා බැලීමටත්;

(ii) මෙම එක් එක් ආනයනික පිටි කිරි වෙළෙඳුන්, ආනයනකරුවන්, වෙළෙඳ ක්ෂේත්‍රය තුළ කෙරෙන දැවැන්ත ප්‍රචාරක ව්‍යාපාරය පීඩාකාරී ලෙස ජනතාවට බලපානවාද යන්න සොයා බැලීමටත්;

(iii) මෙම ආනයනික පිටි කිරි වෙළෙඳුන්, ආනයනකරුවන්, බෙදාහරින්නන් විසින් කරන අසාධාරණ හා/හෝ අනවශ්‍ය හා අතිශයෝක්තියෙන් යුක්ත තරඟකාරී වෙළෙඳ ප්‍රචාරක කටයුතු තුළින් වෙළෙඳ පොලේ පිටි කිරි වල මිල අනවශ්‍ය ලෙස වැඩි වෙනවාදැයි සොයාබැලීමටත්;

(ඈ) (i) මෙම ආනයනික පිටි කිරි වෙළෙඳුන්, ආනයනකරුවන් හා අලෙවිකරුවන් විසින් ජනතා අරමුදල් වක්‍ර ලෙස ප්‍රතිලාභ වශයෙන් ලබා ගැනීම සඳහා ආනයනික සහන, බදු සමා හා වෙනත් සහන ලබා ගන්නේද යන්න සොයා බැලීම සඳහාත්;

(ii) මෙම ආනයනික පිටි කිරි ජාත්‍යන්තර පිළිගත් ප්‍රමිතීන්වලට අනුකූල නොමැති හා/හෝ තත්වයෙන් බාල නම් හා/හෝ අඩංගුව හා සංයුතිය ගැන ප්‍රචාරක මාධ්‍ය තුළ බොරු කර ජනතාව රවටයි නම් ඉහත සඳහන් නා නා විධ බදු සහන හා වෙනත් සහන ලබා දීම සාධාරණ හා යුක්තිසහගත දැයි සොයා බැලීම සඳහාත්;

(ඉ) ඉහත සඳහන් කාරණා විශ්ලේෂණයෙන් අනතුරුව;

(i) ඊට අදාළ අවශ්‍ය නීතිමය තත්වයන් සලකා බලා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට;

(ii) මෙයට අදාළ ආනයන, තත්ව පාලන, සෞඛ්‍ය, රේගු, ආහාර හා පාරිභෝගික ආරක්ෂණ අධිකාරි ආයතන සඳහා අවශ්‍ය උපදෙස් ලබා දීමට;

(iii) එමගින් ආනයනකරුවන්, පාරිභෝගිකයින් ආරක්ෂා කිරීමටත්, ජනතාවගේ මූලික අයිතිවාසිකම් හා සෞඛ්‍ය ආරක්ෂණය තහවුරු කිරීම සඳහාත් සමස්තයක් වශයෙන් මේ සම්බන්ධ සියලු ආයතනයන් ගුණාත්මකව ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය නිර්දේශ සැකසීමටත්;

(ඊ) කෘෂිකර්මය මුල් කරගත් දේශීය ආර්ථිකය ශක්තිමත් කිරීමේ රාජ්‍ය ප්‍රතිපත්තිය පෙරටු කොට ගත් වැඩ පිළිවෙළෙහි එක් ප්‍රධාන අංගයක්වූ ශ්‍රී ලංකාව කිරිවලින් ස්වයංපෝෂිත කිරීමේ ඉලක්කයන් සපුරා ගැනීමට අපහසුවන පිටි කිරි ප්‍රචලිත කිරීමේ ව්‍යාපාරය මගින් ප්‍රබල ලෙස බලපාන කරුණු කාරණා සොයා බැලීමට ද;

පාර්ලිමේන්තුවට පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කිරීම පිණිස විශේෂ කාරක සභාවක් පත් කළ යුතු යැයි මෙම සභාව යෝජනා සම්මත කරයි.

(2.) (අ) එම කාරක සභාව සහ එහි සභාපතිවරයා කථානායකතුමා විසින් නම් කරනු ලැබිය යුතු ය.

(ආ) ස්ථාවර නියෝග 95 හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, මෙම කාරක සභාව සාමාජිකයින් විසි එක් (21) දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත විය යුතු ය.

(3.) ඒ කාරක සභාවට,—

(අ) සිය ගණපූරණය නියම කර ගැනීමට බලය තිබිය යුතු ය.

(ආ) කාරක සභාව ඉදිරියේ පෙනී සිටින ලෙස යම් තැනැත්තකු කැඳවීමට ද, යම් ලේඛනයක් හෝ වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස යම් තැනැත්තකුට නියම කිරීමට ද, ඉහත සඳහන් කරුණු පූර්ණ ලෙස සලකා බැලීම පිණිස අවශ්‍ය යයි කාරක සභාව කල්පනා කරන ලිඛිත හෝ වාචික සියලු සාක්ෂි ලබා ගැනීමට හා භාර ගැනීමට ද බලය තිබිය යුතු ය.

(ඇ) කාරක සභාව වෙත සහාය ලබා ගැනීම පිණිස අදාල ක්ෂේත්‍රයන්හි විශේෂඥයන්ගේ සහ ප්‍රවීණයන්ගේ සේවාවන් ලබා ගැනීමට ද බලය තිබිය යුතු ය.

(ඈ) කලින් කලට වාර්තා කිරීමට සහ පාර්ලිමේන්තුව අඩාලව කල් තබන ලද්දේ වුව ද, රැස්වීම් පවත්වාගෙන යෑමට ද බලය තිබිය යුතු ය.

(4.) සියලුම කරුණු සැලකිල්ලට භාජනය කිරීමෙන් අනතුරුව, කාරක සභාව පත්කර වසරක් ඇතුළත හෝ පාර්ලිමේන්තුවේ අභිමතය පරිදි නියම කරනු ලබන පසු දිනයක හෝ වාර්තාව ඉදිරිපත් කළ යුතු ය.

පා.49/'09

ගරු රවි කරුණානායක මහතා
ගරු තිස්ස අත්තනායක මහතා
ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා
ගරු චන්ද්‍රානි බණ්ඩාර ජයසිංහ මහත්මිය
ගරු ඒ. එම්. එම්. නවුෂාඞ් මහතා
ගරු රවීන්ද්‍ර සමරවීර මහතා
ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා

ගරු මොහොමඩ් ෂෆීක් රජාබ්දීන් මහතා

ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා

ගරු දුනේෂ් ගන්කන්ද මහතා

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා,— අනවසර මුදල් ආයතනවල ක්‍රියාකාරකම් විමර්ශනය කිරීම සඳහා වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව,— සමාගම් කිහිපයක් විසින් මහජනතාවගෙන් මුදල් තැන්පතු භාරගන්නා බව අනාවරණය වී ඇති හෙයින් ද;

මෙකී සමාගම් විසින් ඉහල පොලියක් ගෙවන බව පවසා මහජනතාවගෙන් මුදල් තැන්පතු ලබාගැනීම හේතුවෙන් ඉතා විශාල පිරිසක් රුපියල් බිලියන ගණනක මුදල් අහිමිකරගෙන ඇති හෙයින් ද;

මෙකී කටයුතු ප්‍රසිද්ධියේ සිදුකර ඇති හෙයින් ද;

"රටේ ආර්ථික සහ මිල ස්ථාවරත්වය සහ මූල්‍ය පද්ධතියේ ස්ථාවරත්වය සුරැකීම තම මූලාය පරමාර්ථයක්ය යන වගකීමෙන් බැඳී සිටින්නේය" යැයි ප්‍රකාශ කරන ශ්‍රී ලංකා මහ බැංකුව විසින්, මෙකී ආයතන අධීක්ෂණය, සුපරීක්ෂණය සහ නියාමනය නොකර සිටිමින් තම කාර්යභාරය සම්පූර්ණයෙන් පැහැරහැර ඇති බැවින් ද;

"ගෝල්ඩන් කී ක්‍රෙඩිට් කාඩ්" සමාගම සහ එහි අනුබද්ධ සමාගම් කීපයක්ද, "ඔකඳ" යන නමින් ක්‍රියාත්මක සමාගමක්ද, "සක්විති" යන නමින් ක්‍රියාත්මක තවත් පුද්ගලයෙක්ද, "දඹුවම් මුදලාලි" යන නමින් යුත් තවත් සමාගමක් සහ සීමාසහිත ශ්‍රී ලංකා මානව සම්පත් සංවර්ධන සමූපකාර බැංකු සංගමය ද මෙයට සම්බන්ධ වී ඇති සමාගම් කීහිපයක් වන හෙයින් ද;

මෙකී සමාගම් කඩාවැටීම හේතුවෙන් කීපදෙනෙකුගේම ජීවිත කාලයක් පුරා කළ ඉතිරිකිරීම් අහිමි වී සම්පූර්ණයෙන්ම අසරණ තත්වයට පත්වී ඇති හෙයින් ද;

මෙකී කඩාවැටීම හේතුවෙන් අහිමිවී ඇති මුළු මුදල රුපියල් බිලියන 300 ඉක්මවා ඇතැයිද, ඒ නිසා මහජන ආදායම අහිමිවී ඇතැයිද වාර්තා වී ඇති හෙයින් ද;

මෙකී ගැටලු මතුවීම නිසා අනෙකුත් මූල්‍ය සමාගම්වල තැන්පත් මුදල් ආපසු ගැනීමට පෙළඹී ඇති නිසා ඒවාටද මෙයින් බලපෑමක් ඇතිවී තිබෙන හෙයින් ද;

මෙවැනි ගැටලු වැඩි කාලයක් යාමට පෙර මැඩ පවත්වා ගත හැකි යැයි මහ බැංකුවේ අධිපතිවරයා විසින් 2006 නොවැම්බර් මස 02 වැනි දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී සහතික කර ඇති හෙයින් ද; සහ

මහ බැංකුව මේ දක්වා කිසිදු ඵලදායි පියවරක් නොගත් බව පෙනී යන නිසා මෙම අසාර්ථක වූ සමාගම්වල වත්කම් අධීක්ෂණය කරන ආකාරය පිළිබඳ විශ්වාසය බිඳී යාමක් ඇති හෙයින් ද;

(අ) මෙම ක්‍රියාකාරකම් හා සම්බන්ධ සම්පූර්ණ මුදල් ප්‍රමාණය;

(ආ) මුදල් විශාල ප්‍රමාණයක් තැන්පත් කර ඇති තැන්පත්කරුවන් වෙත රහසිගතව එම මුදල් ආපසු ගෙවා තිබේද; එසේ කර තිබේ නම්, එම පුද්ගලයන් කවුරුන්ද;

(ඇ) මෙම සමාගම්වල ක්‍රියාකාරකම් අධීක්ෂණය, සුපරීක්ෂණය සහ නියාමනය කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව අසමත් වීමට හේතු;

(ඈ) තැන්පත්කරුවන්ගේ අයිතීන් සුරක්ෂිත කිරීමට අවශ්‍ය වන පියවර සහ ඔවුන්ට සහන ලබාදීම;

(ඉ) මෙම සමාගම් සතු ඕනෑම වත්කමක් විකිණීමට හෝ පැවරීමට අදාළවන ඕනෑම ගනුදෙනුවක් තැන්පත්කරුවන්ගේ යහපත සඳහා සිදු කරන බව තහවුරු කිරීමට අවශ්‍ය පියවර;

(ඊ) අනාගතයේදී මේ ආකාරයේ සිද්ධීන් සිදුවීම වැළැක්වීම සඳහා මූල්‍ය නීතිය සහ මේ කාරණාවලට අදාළ අනෙකුත් නීති යටතේ ගතහැකි පියවර කවරේද;

(උ) මෙම සමාගම් බිඳවැටීම නිසා රාජ්‍ය මූල්‍යයට ඇතිවන බලපෑම;

(ඌ) තැන්පත්කරුවන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා පවතින නීතිවලට අවශ්‍යවන සංශෝධන හෝ නව නීති පැනවීමේ අවශ්‍යතාවය; සහ

(එ) කාරක සභාව විසින් අදාළ යැයි තීරණය කරනු ලබන අනෙකුත් කාරණා;

යන කරුණු පිළිබඳව විමසා බලා වාර්තා කිරීම සඳහා පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කරනු ලැබිය යුතු යැයි මෙම සභාව යෝජනා සම්මත කරයි.

(2.) (අ) එම කාරක සභාව සහ එහි සභාපතිවරයා කථානායකතුමා විසින් නම් කරනු ලැබිය යුතු ය.

(ආ) ස්ථාවර නියෝග 95 හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, මෙම කාරක සභාව සාමාජිකයින් විසි එක් (21) දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත විය යුතු ය.

(3.) ඒ කාරක සභාවට,—

(අ) සිය ගණපූරණය නියම කර ගැනීමට බලය තිබිය යුතු ය.

(ආ) කාරක සභාව ඉදිරියේ පෙනී සිටින ලෙස යම් තැනැත්තකු කැඳවීමට ද, යම් ලේඛනයක් හෝ වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස යම් තැනැත්තකුට නියම කිරීමට ද, ඉහත සඳහන් කරුණු පූර්ණ ලෙස සලකා බැලීම පිණිස අවශ්‍ය යයි කාරක සභාව කල්පනා කරන ලිඛිත හෝ වාචික සියලු සාක්ෂි ලබා ගැනීමට හා භාර ගැනීමට ද බලය තිබිය යුතු ය.

(ඇ) කාරක සභාව වෙත සහාය ලබා ගැනීම පිණිස අදාල ක්ෂේත්‍රයන්හි විශේෂඥයන්ගේ සහ ප්‍රවීණයන්ගේ සේවාවන් ලබා ගැනීමට ද බලය තිබිය යුතු ය.

(ඈ) කලින් කලට වාර්තා කිරීමට සහ පාර්ලිමේන්තුව අඩාලව කල් තබන ලද්දේ වුව ද, රැස්වීම් පවත්වාගෙන යෑමට ද බලය තිබිය යුතු ය.

(4.) සියලුම කරුණු සැලකිල්ලට භාජනය කිරීමෙන් අනතුරුව, කාරක සභාව පත්කර වසරක් ඇතුළත හෝ පාර්ලිමේන්තුවේ අභිමතය පරිදි නියම කරනු ලබන පසු දිනයක හෝ වාර්තාව ඉදිරිපත් කළ යුතු ය.

පා.50/'09

ගරු රවි කරුණානායක මහතා

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා

ගරු කබීර් හෂීම් මහතා

ගරු රුක්මන් සේනානායක මහතා,— ලෝක වෙළෙඳපොළේ පිටි කිරි මිල පහත වැටීමේ ප්‍රතිලාභය පාරිභෝගිකයා වෙත ලබාදීම සම්බන්ධයෙන් සොයා බලා වාර්තා කිරීම සඳහා වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව,— පසුගිය මාස හය තුළ දී ලෝක වෙළෙඳ පොළේ පිටි කිරි මිල පහත වැටුනු හෙයින් ද;

පිටි කිරි මිල පහත වැටීමේ ප්‍රතිලාභය පාරිභෝගිකයා වෙත ලබාදීමට ආණ්ඩුව අසමත් වී ඇති හෙයින් ද;

ලෝක වෙළෙඳ පොළේ පිටි කිරි මිල පහත වැටීමේ ප්‍රතිලාභය තම ජනතාවට ලබාදීමට ලෝකයේ අනෙකුත් රටවල් සියල්ල ම පියවර ගෙන ඇති හෙයින් ද;

ලෝක වෙළෙඳපොළේ පිටි කිරි මිල අඩු වූ අනුපාතය සැලකිල්ලට ගැනීමේදී ඉන් කොටසකින් හෝ මිල පහත හෙළීම තුළින් එම මිල අඩුවීමේ ප්‍රතිලාභය ජනතාවට ලබාදීමට මෙම ආණ්ඩුව විසින් පියවර ගෙන නොමැති හෙයින් ද;

ආනයන සහ බෙදාහැරීම මත විවිධ බදු පනවා ඇති මෙම ආණ්ඩුව තනිකරම කෘත්‍රිම මිලකට පිටි කිරි අලෙවි කිරීම තුළින්, ජනතාවගේ සුභසාධනය භාර එකම භාරකරු වූ ආණ්ඩුව කළුකඩ කාරයකු වී ඇති හෙයින් ද;

මෙතෙක් කිරි නිෂ්පාදනය ආරක්ෂා කර ඇත්තේ පිටි කිරිවල ගුණාත්මක බව සම්බන්ධයෙන් හෙයින් ද; සහ

ලෝක වෙළෙඳපොළේ පිටි කිරි මිල පහත වැටීමේ සහනය ජනතාවට අහිමි කිරීමේ රහසිගත, අමානුෂික උත්සාහයක මේ ආණ්ඩුව නියැළෙන්නේ දරුණු මූල්‍ය අර්බුදයකට ආණ්ඩුව මුහුණ දී ඇති නිසා බව පැහැදිලි වන හෙයින් ද;

(අ) ලෝක වෙළෙඳ පොළේ විවිධ වෙළෙඳ නාම වල පිටි කිරි මිල අඩුවීම,

(ආ) පිටි කිරි ආනයනය සහ විකිණීම සම්බන්ධයෙන් ආණ්ඩුව විසින් පනවා ඇති විවිධ බදු,

(ඇ) පිටි කිරි විකිණීම මගින් යථාර්ථවාදී නොවන, කෘතිම ලාභ උපයමින් ආණ්ඩුවේ මූල්‍යමය අපහසුතාවන් පිරිමසා ගැනීමට උත්සාහ දරන්නේ ද,

(ඈ) පිටි කිරි මත පනවා ඇති යථාර්ථවාදී නොවන බදු වර්ග ඉවත්කරමින් පිටි කිරි වල මිල තීරණය කර නියම කිරීම,

(ඉ) මේ පිළිබඳ ආනුෂාංගික අනෙකුත් කරුණු;

යනාදී කරුණු පිළිබඳව සොයාබලා පාර්ලිමේන්තුවට වාර්තා කිරීම සඳහා පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත්කළ යුතු බව මෙම සභාව යෝජනා සම්මත කරයි.

(2.) (අ) එම කාරක සභාව සහ එහි සභාපතිවරයා කථානායකතුමා විසින් නම් කරනු ලැබිය යුතු ය.

(ආ) ස්ථාවර නියෝග 95 හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, මෙම කාරක සභාව සාමාජිකයින් විසි එක් (21) දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත විය යුතු ය.

(3.) ඒ කාරක සභාවට,—

(අ) සිය ගණපූරණය නියම කර ගැනීමට බලය තිබිය යුතු ය.

(ආ) කාරක සභාව ඉදිරියේ පෙනී සිටින ලෙස යම් තැනැත්තකු කැඳවීමට ද, යම් ලේඛනයක් හෝ වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස යම් තැනැත්තකුට නියම කිරීමට ද, ඉහත සඳහන් කරුණු පූර්ණ ලෙස සලකා බැලීම පිණිස අවශ්‍ය යයි කාරක සභාව කල්පනා කරන ලිඛිත හෝ වාචික සියලු සාක්ෂි ලබා ගැනීමට හා භාර ගැනීමට ද බලය තිබිය යුතු ය.

(ඇ) කාරක සභාව වෙත සහාය ලබා ගැනීම පිණිස අදාල ක්ෂේත්‍රයන්හි විශේෂඥයන්ගේ සහ ප්‍රවීණයන්ගේ සේවාවන් ලබා ගැනීමට ද බලය තිබිය යුතු ය.

(ඈ) කලින් කලට වාර්තා කිරීමට සහ පාර්ලිමේන්තුව අඩාලව කල් තබන ලද්දේ වුව ද, රැස්වීම් පවත්වාගෙන යෑමට ද බලය තිබිය යුතු ය.

(4.) සියලුම කරුණු සැලකිල්ලට භාජනය කිරීමෙන් අනතුරුව, කාරක සභාව පත්කර වසරක් ඇතුළත හෝ පාර්ලිමේන්තුවේ අභිමතය පරිදි නියම කරනු ලබන පසු දිනයක හෝ වාර්තාව ඉදිරිපත් කළ යුතු ය.

* **සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**